www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: ජවිපෙට අනුබද්ධිත සමිතිය සමාජවාදී සමානතා පක්ෂයට එරෙහිව තර්ජනයක් නිකුත් කරයි

**Sri Lanka: JVP-affiliated union issues threat against Socialist Equality Party**

**කේ. රත්නායක විසිනි**
**2007 ඔක්තෝබර් 27**

සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) අනුබද්ධිත වෘත්තීය සමිතියක් මහ බැංකු සේවක සංගමයේ (මබැසේස) නායකත්වයේ සිටින සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජිකයන්ට හා ආධාරකරුවන්ට එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුව තුල අන්තරායකාරී තර්ජනයක් නිකුත් කර තිබේ.

සසපටත් එහි පූර්වගාමියා වන විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයටත් (විකොස) මහ බැංකුව තුල දේශපාලන මූලධර්ම සඳහා සටන් වැදීමේ ද කම්කරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමේ ද දිග කාලීන ඉතිහාසයක් පවතී. සසප සාමාජික කේ.බී. මාවිකුඹුර සහ සසප ආධාරකරුවකු වන එම්.ඩබ්ලිව්. පියරත්න 2001 සිට මේ දක්වා පිලිවෙලින් සමිතියේ සභාපති සහ භාන්ඩාගාරික ලෙස කටයුතු කරයි. මාවිකුඹුර 1985 තරම් ඈතක සිට සමිති නායකත්වයේ විවිධ තනතුරු දරා ඇත.

ජවිපෙ සහ එයට අනුබද්ධිත සමිතිය වන ශ්‍රී ලංකා මහ බැංකු සේවක සංගමය (ශ්‍රීලමබැසේස) සසපටත් රට තුල උත්සන්න කෙරෙමින් පවතින සිවිල් යුද්ධයට සසප දක්වන විරුද්ධත්වයටත් සතුරු ය. ජවිපෙ ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුවට සහයෝගය දෙනවා පමනක් නොව, "ත්‍රස්තවාදී" දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය මුලුමනින් ම විනාශ කරනු පිනිස මිලිටරි ආක්‍රමනය උත්සන්න කිරීමට ආන්ඩුව ක්‍රියා කල යුතු බවත් අවධාරනය කරයි.

ශ්‍රීලමබැසේස, සැප්තැම්බර් 14 දා පැවති මබැසේස වාර්ෂික මහා සභා රැස්වීමෙන් අනතුරුව මබැසේස නායකයන්ට එරෙහිව ප්‍රකෝපකාරී පත්‍රිකාවක් නිකුත් කලේ ය. රැස්වීමේ බහුතරයක් මාවිකුඹුර හා පියරත්න විසින් ඉදිරිපත් කරන ලද යුද්ධය, වැඩ කරන ජනතාව මත එය පටවන බර සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන් මැඩීම හෙලා දකින දේශපාලන යෝජනාවක් වැඩි ඡන්දයෙන් සම්මත කලේ ය. වාර්ගික භේදයන් කපා ගෙන ඒකාබද්ධ වන ලෙසත් සමාජවාදය සඳහා වූ වඩා පුලුල් අරගලයක කොටසක් ලෙස දිවයිනේ උතුරෙන් හා නැගෙනහිරෙන් මිලිටරිය ඉවත් කිරීමක් ඉල්ලා සිටින ලෙසත් එම යෝජනාව කම්කරුවන්ට කැඳවුම් කලේ ය.

සැප්තැම්බර් 21 දාතමින් යුත් ශ්‍රීලමබැසේස පත්‍රිකාව "එල්ටීටීඊ ත්‍රස්තවාදයට උඩ ගෙඩි දෙන ව්‍යාපෘතියක් කලක සිට දියත් කර ගෙන යාම" සම්බන්ධයෙන් මාවිකුඹුරට චෝදනා කලේ ය. එය 86 දෙනෙකු මරා දමමින් තවත් 1000කට වැඩි පිරිසකට බරපතල තුවාල සිදු කරමින් 1996 දී මහ බැංකුවට එල්ල වූ එල්ටීටීඊ බෝම්බ ප්‍රහාරය ගැන මතක් කරයි." මේ අනුව, එල්ටීටීඊ ත්‍රස්තවාදයෙන් එක් වරක් බැට කෑ අපට සිංහල කොටින්ගේ සහාය ඇතිව හෙට දිනයේ දී නැවත ප්‍රහාරයකට ගොදුරු නොවන්නේ යයි කාට නම් කිව හැකි ද?" යනුවෙන් පත්‍රිකාව ප්‍රකාශ කලේ ය.

සිංහල වර්ගවාදයේ වාග්මාලාවට අනුව," සිංහල කොටි" නැතහොත් එල්ටීටීඊ ආධාරකරුවන් යන්න යමකු ද්‍රෝහියකු ලෙස හෙලා දැකීමකට සම වේ. මාවිකුඹුර හා පියරත්න සමිති නායකත්වයෙන් ඉවත් කරන ලෙසත් නැත හොත් එම සමිතියෙන් ඉවත් වී ශ්‍රී ලංකා මහ බැංකු සේවක සංගමයට බැඳෙන ලෙසත් ශ්‍රීලමබැසේස දේශහිතෛෂී අවලාද ප්‍රහාරය මබැසේස සාමාජිකයන්ගෙන් ඉල්ලා සිටියේ ය. එහෙත් ජනාධිපති රාජපක්ෂගේ යලි ඇරඹූ යුද්ධය මගින් නිර්මානය කෙරුනු ගිනියම් වූ දේශපාලන වාතාවරනය තුල සිදු කෙරුනු එම හෙලා දැකීම ගැබ් කර ගන්නේ දේශපාලන දඩයමට ලක් කිරීමේ, කෙලින් ම අත් අඩංගුවට ගැනීමේ හෝ ශාරීරික ප්‍රචන්ඩත්වය මුදා හැරීමේ ඊට වඩා දුෂ්ට තර්ජනයකි.

පසුගිය වසරක කාලය මුලුල්ලේ කොලඹ මෙන් ම උතුරු හා නැගෙනහිර පලාත්වල සිය ගනන් ජනයා, මිලිටරි අනුග්‍රහය ලබන ඝාතක කල්ලිවල මෙහෙයුම් වෙත සැකය යොමු කෙරෙන, ඝාතනයන්ට හෝ "අතුරුදහන් කිරීම්වලට" ලක්ව ඇත. රටේ බල පවත්වන රුදුරු හදිසි නීති රෙගුලාසි සහ ත්‍රස්තවාදය වැලැක්වීමේ නීති රීති යටතේ තවත් බොහෝ ගනනක් එල්ටීටීඊ "ත්‍රස්තවාදීන්" ලෙස හිතුවක්කාරී ලෙස රඳවා ගෙන සිටී.

ජවිපෙ ම ප්‍රචන්ඩත්වය හා ඝාතන සම්බන්ධයෙන් කුප්‍රකට ය. 1980 ගනන් අග දී, යුද්ධය අවසන් කිරීමට කොලඹ හා නව දිල්ලිය අතර ඇති කර ගැනුනු ඉන්දු-

ලංකා ගිවිසුමට එරෙහි ඔවුන්ගේ ප්‍රතිගාමී දේශප්‍රේමී උද්ඝෝෂනයට විරුද්ධ වු දේශපාලන විරුද්ධවාදීන්, වෘත්තීය සාංගමිකයන් හා කම්කරුවන් සිය ගනනක් මරා දැමීමට ජවිපෙ මැර කල්ලි ක්‍රියා කලහ. විකොස සහ මබැසේස තුල සිටි එහි සාමාජිකයෝ කම්කරුවන් හා ඔවුන්ගේ සංවිධාන ආරක්ෂා කර ගැනීමේ එක්සත් පෙරමුනක් සඳහා ගෙන ගිය සටනේ පෙරමුනේ ම සිටියහ.

ජවිපෙ මැරයෝ 1988 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල දී, විකොස සාමාජිකයන් තිදෙනෙක් -- ආර්.ඒ. පිටවෙල, පී.එච්. ගුනපාල සහ ග්‍රේෂන් ගීකියනගේ -- මරා දැමූහ. සිය දේශප්‍රේමී විරෝධතාවන්ට හා වර්ජනයන්ට එක් වන ලෙස ජවිපෙ කල ඉල්ලීම්වලට මබැසේස විරුදධ වූ හෙයින් එය තුල සිටි විකොස සාමාජිකයෝ විශේෂයෙන් ම ඉලක්ක බවට පත් වූහ. 1988 දෙසැම්බර් 26 දා ජවිපෙ විසින් මාවිකුඹුර මරා දැමීමට තුවක්කුකරුවන් හතර දෙනෙක් යවන ලදි. ඔහුගේ නිවස ඉදි කෙරෙන භූමිය කරා පැමිනි ඔවුහු ඔහු වාසය කරන්නේ කොහි ද යන්න එහි සිටි කම්කරුවන්ගෙන් විමසූහ.

මීට මාස තුනකටත් වඩා අඩු කලකට පෙරාතුව. අගෝස්තු මස මුල දී, ජවිපෙට අනුබද්ධිත අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලයේ සාමාජිකයෝ, පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ දී ඉරාකයේ යුද්ධයට හා ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධට එරෙහිව උද්ඝෝෂනය කරමින් සිටි සසප සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) ව්‍යාපාරයේ සාමාජිකයන්ට පහර දෙන බවට තර්ජනය කලහ. සසජාශි සංවිධානයට එරෙහි ප්‍රචන්ඩ තර්ජන නතර කරන ලෙස ඉල්ලමින් සසප ජවිපෙ ලේකම් ටිල්වින් සිල්වා වෙත ලිපියක් යැවූ මුත් එයට කිසිදු පිලිතුරක් ලැබී නැත.

ශ්‍රීලමබැසේස පත්‍රිකාව, පසුගිය පෙබරවාරියේ දී දුම්රිය වෘත්තීය සමිතිවල "සිංහල කොටි" අත් අඩංගුවට ගත් සිද්ධියකට සැඳහුම් කරමින් සිය තර්ජනය අවධාරනය කරයි. තමන් දැවැන්ත කුමන්ත්‍රනයක් බිඳ දැමූ බවට, අති මහත් ප්‍රචාරයකින් යුතුව. මිලිටරිය පුරසාරම් දෙඩී ය. වෘත්තීය සමිති වාර පුවත්පතක් පල කිරිමෙහි යෙදී සිටි තිදෙනෙක් අත් අඩංගුවට ගෙන පසුව පැය 48කටත් වඩා අඩු කලක දී මාධ්‍ය ඉදිරියේ ප්‍රදර්ශනය කෙරුනේ, තමන් ඊට පෙර අප්‍රසිද්ධව පැවති විප්ලවකාරී විමුක්ති ව්‍යාපාරය (විවිව) නම් සංවිධානයක සාමාජිකයන් බවටත් එල්ටීටීඊයෙන් ආයුධ හා පුහුනුව ලැබූ බවටත් ඔවුන් "පාපොච්චාරනය" කල බවකි. ඉන් පසුව තව දුරටත් අත් අඩංගුවට ගැනීම් සිදු විය.

ආරම්භයේ පටන් ම, විවිව සිද්ධිය රාජ්‍ය විසින් රඟ දැක්වුනු ප්‍රකෝපකරනයක සැකය මතු කලේ ය. මසකට පසුව, සන්ඩේ ලීඩර් පත්‍රය වාර්තා කලේ එල්ටීටීඊ පුහුනුව සංවිධානය කිරීමට සහභාගි වූ මූලික පුද්ගලයෙක් මිලිටරි රහස් ඔත්තු අංශය වෙනුවෙන් වැඩ කල "ශර්මාල්" නම් තැනැත්තෙක් බව යි. එපමනක් නොව, එල්ටීටීඊ සාමාජිකයකු වනවා වෙනුවට, ශර්මාල් ජවිපෙට සම්බන්ධව සිටි අතර ජ්‍යෙෂ්ට ජවිපෙ නායකයන් සමග දිගට ම සමීප සම්බන්ධතා පවත්වා ගෙන ගියේ ය. ජවිපෙ පාර්ලිමේන්තු නායක විමල් වීරවංශ විසින් ඔහු ආරක්ෂක ලේකම් ගෝටාභය රාජපක්ෂට හඳුන්වා දෙන ලදි.

දැන් මාස අටක් තිස්සේ බූස්ස රැඳවුම් කඳවුරේ රඳවා ගෙන සිටින ක්‍රියාකාරින් 24 දෙනොගෙන් එක් අයකුට වත් එරෙහිව චෝදනා ඉදිරිපත් කොට නැත. එහෙත් ජවිපෙ ඔවුන් "සිංහල කොටි" ලෙස හෙලා දැකීමේ ද "ද්‍රෝහී" සමිතිවලින් බිඳෙන ලෙස කම්කරුවන්ගෙන් ඉල්ලා සිටීමේ ද සිය උද්ඝෝෂනය දිගට ම ගෙන යයි. ඕනෑම වර්ජනයකට හෝ විරෝධතාවකට එරෙහි ආන්ඩුවේ ප්‍රචාරක ව්‍යාපාරයේ කොටසක් ලෙස යොදා ගැනෙන මෙම කුමන්ත්‍රනය සැලසුම් කිරීමෙහි ලා ආරක්ෂක හමුදාවන් සමග තමන් ගෙන ගිය සහයෝගය පිලිබඳව ජවිපෙ මුලුමනින් ම නිහඬව සිටින බව අමුතුවෙන් කිව යුතු නැත.

මාවිකුඹුර වසර ගනනාවක් තිස්සේ "එල්ටීටීඊ ත්‍රස්තවාදයට" සහාය දෙන බවටත් මහ බැංකුවට එල්ල කෙරෙන තවත් එල්ටීටීඊ බෝම්බ ප්‍රහාරයක් සැලසුම් කිරීමෙහි ලා උදව් කරන බවටත් ශ්‍රීලමබැසේස කරන චෝදනා අවලාදයන් ය. එල්ටීටීඊයේ වාර්ගික දේශපාලනය ඇතුලු ජාතිකවාදයේ හා ස්වෝත්තමවාදයේ සියලු රූපකාරයන්ට එරෙහි වීමේ දිගු කාලින වාර්තාවක් සසප/විකොස සතුව පවතී. විකොස මහ බැංකුවේ බෝම්බ ප්‍රහාරය ප්‍රසිද්ධියේ හෙලා දකිමින් පැහැදිලි කලේ. ජවිපෙ වැනි ස්වෝත්තමවාදී පක්ෂවලට තව දුරටත් දේශපාලන වේදිකාවක් සම්පාදනය කිරීමටත් කම්කරු පන්තිය භේද කිරීමටත් එය හේතු වනු ඇති බව යි.

උතුරෙන් හා නැගෙනහිරෙන් වහාම හා කොන්දේසි විරහිතව ආරක්ෂක හමුදා ඉවත් කරන ලෙස සසප කරන ඉල්ලීමෙන් එල්ටීටීඊයට සහයෝගය දීමක් අදහස් නොවේ. උතුරු හා නැගෙනහිර පලාත් දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ පවතින්නේ, විශේෂයෙන් ම දෙමල ජනයාගේ මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් කුමානුකූලව මර්දනය කෙරුනු තථ්‍ය වසයෙන් ම යුද නීති පාලනයක් යටතේ ය. මෙම ප්‍රදේශවලින් හමුදා ඉවත් කරන ලෙස ඉල්ලා සිටීම, කම්කරු පන්තියේ එකමුතුව ගොඩනැගීමේ ද ආන්ඩුවට හා එල්ටීටීඊයට එරෙහිව ඒකාබද්ධ අරගලයක් තුල දෙමල, සිංහල හා මුස්ලිම් කම්කරුවන් බලමුලුගැන්වීමේ ද අත්‍යවශ්‍ය ප්‍රථම පියවර යි.

ජවිපෙ සහ එහි වෘත්තීය සමිතිය, මබැසේස තුල සසප යොජනාවට ප්‍රතික්‍රියා කොට ඇත්තේ, ඔවුන්ගේ යුද-

ගැති වර්ගවාදී උන්මාදය මහ බැංකුව තුල පමනක් නොව වඩා පුලුල් මහජනතාව අතර වඩ වඩා අප්‍රසාදයට ලක් වෙමින් පවතින නිසා ය. කම්කරුවන් ආරක්ෂා කරන බවට ඔවුන් සිදු කරන සියලු කියාපෑම්වලට හා විටින් විට කරන සමාජවාදී පුච්චානම් කතාවලට විපරීතව. ජවිපෙ වැඩ කරන ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ යුද්ධය සඳහා කැප කිරීම් කරන ලෙස යි. මිලිටරිය සඳහා රුපියල් බිලියන ගනන් වැය කරන ගමන්, ආන්ඩුව මුදල් නැති බව කියමින් රාජ්‍ය අංශයේ විවිධ ආයතනවල කම්කරුවන්ගේ වැටුප් ඉල්ලීම් නැවත නැවතත් ප්‍රතික්ෂේප කර තිබේ.

සසප යෝජනාව පැහැදිලි කරන පරිදි: "යුද්ධය සඳහා කෙරෙන දැවැන්ත වියදම ජීවන තත්වයන් හා සමාජ කොන්දේසි විනාශ කිරීම ලෙස වැඩ කරන ජනතාව මත පැටවෙන අතර ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්වලට පහර දීම සිදු වේ. . . . ඉහල යන උද්ධමන රේට්ටුව දැන් සියයට 17.3ක මට්ටමේ ය. රුපියලේ අගය ඩොලරයට සාපේක්ෂව පහලට රූටා යමින් පවතී. කම්කරුවන්, ශිෂ්‍යයන් හා පීඩිතයන් විසින් තම දැවෙන ප්‍රශ්න විසඳගැනීම සඳහා දියත් කරන සෑම අරගලයක් ම යුද්ධයේ නාමයෙන් මඬිනු ලබන අතර එසේ සටන් වදින්නන් එල්.ටී.ටී.ඊ. ආධාරකරුවන් ලෙස හංවඩු ගසා ඔවුන්ට එරෙහි රාජ්‍ය හා මැර ප්‍රකෝපකාරිත්වයන් මුදා හරිමින් පවතී."

යුද්ධයට එරෙහි අරගලයකින් තොරව, කම්කරුවන්ගේ අති මූලික අයිතීන් සහ කොන්දේසි ආරක්ෂා කර ගත නොහැකි බව ශ්‍රීලමබැසේස ක්‍රියාකලාපය මගින් විචිත්‍රවත් ලෙස පෙන්නුම් කෙරෙයි. මේ වසරේ වැටුප් සාකච්ඡා තුල දී, ශ්‍රීලමබැසේස පහල ශ්‍රේනිවල සේවකයන්ට විශාල වසයෙන් වෙනස්කම් කරන වැටුප් සූත්‍රයක් පිලිගත්තේ ඉල්ලීම් ලබා දීමේ දී මහ බැංකු අධිපති දැක්වූ "නම්‍යශීලීත්වය" සම්බන්ධයෙන් ඔහුට ප්‍රශංසා කරමිනි. එම සූත්‍රය වෙනස් කෙරුනේ මබැසේස මැදිහත්වීම නිසාම පමනි.

ශ්‍රීලමබැසේස පසුගිය මාසයේ නිකුත් කල පත්‍රිකාව අවසන් කරන්නේ එහි "දේශද්‍රෝහී ක්‍රියාවන්" සම්බන්ධයෙන් මබැසේස නායකත්වය හෙලා දකිමින් සහ පහත ආයාචනය කරමිනි: "ශ්‍රී ලංකා මහ බැංකුව තුල රටට ආදරය කරන, ජාතික ආර්ථිකයක් ගොඩනැගිය යුතු බවට හඬක් නගන, බැංකු සේවකයන්ගේ සැබෑ ප්‍රශ්න වෙනුවෙන් පෙනී සිටින, ඒ සඳහා පුද්ගලික අරමුනු බැහැර කල පොදු අරමුනු වෙනුවෙන් කැප වී සිටින වෘත්තීය සමිතිය වන ශ්‍රී ලංකා මහ බැංකු සේවක සංගමය සමග අත්වැල් බැඳ ගන්නා ලෙස වැඩි දුරටත් ඉල්ලා සිටිමු."

වඩ වඩා මහජනයා අතර අප්‍රසාදයට ලක්ව ඇත්තේ රට, ජාතික ආර්ථිකය සහ යුද්ධය ආරක්ෂා කිරීමේ මෙම පිලිවෙත ම ය. 600ක් හෝ ඊට වඩා වැඩි වන මබැසේස සාමාජිකයන්ගෙන් එක් අයෙක් වත් ජවිපෙහි ශ්‍රී ලංකා මහ බැංකු සේවක සංගමයට බැඳීමට ඉල්ලා අස්වී නැත. එහෙත් ශ්‍රීලමබැසේස පත්‍රිකාවට භයානක තර්කනයක් පවතී. කිසිදු දේශපාලන වාසියක් ගසාකෑමට අසමත් වීම, ජවිපෙ අතීතයේ කර ඇතිවාක් මෙන්, වෙනත් වඩා දුෂ්ට විධික්‍රම කරා යාමෙන් ශ්‍රීලමබැසේස නායකත්වය නතර නොකරනු ඇත.

කම්කරු පන්තිය තුල. ශ්‍රීලමබැසේස තර්ජනයන් එලිදරව් කිරීමේ ද ඉදිරියේ දී ඇති විය හැකි මොන යම් හෝ ප්‍රකෝපකරනයකට එරෙහිව මබැසේස නායකත්වය ආරක්ෂා කිරීමේ ද උද්ඝෝෂනයක් දියත් කිරීමට සසප ක්‍රියාත්මක වනු ඇත.

© www.wsws.org